# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,482 - 2026 මාර්තු මස 27 සිකුරාදා - 2026.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් . . . . . . | — |
| පනත් කෙටුම්පත් . . . . . . | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් . . . . . . | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් . . . . . . | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන . . . . . . | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් . . . . . . | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් . . . . . . | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් . . . . . . | — |
| පිස්කල් විකිණීම් . . . . . . | 76 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් . . . . . . | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් . . . . . . | — |
| නොතාරිස් ලැයිස්තුව . . . . . . | — |
| විවිධ දැන්වීම් . . . . . . | 77 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 17 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 02 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**තංගල්ල දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5,
ගාලු පාර, කොළඹ 03.

*.............පැමිණිලිකරු.*

*කොළඹ දිසා අධිකරණයේ*
*නඩු අංකය* : DMB/23/2021.
*තංගල්ල දිසා අධිකරණයේ*
*ඇස්කීසි අංකය* : 14/2025.

*එදිරිව*

1. සුජිත් රොහාන් වනිගසිංහ,
අංක 46/1, ගොඩවනගොඩ, තංගල්ල.

2. පරණ පල්ලිය ගුරුගේ ප්‍රදීපා,
අංක 140, බෙලි අත්ත පාර, තංගල්ල.

*..............විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 27 දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව,

පැමිණිල්ලේ සඳහන් පළමුවන නඩු නිමිත්තේ දැක්වෙන පරිදි මුල් මුදල වන රුපියල් හාරලක්ෂ පනස් හත් දහස් හාරසිය විසිහතයි ශත අනූ හතරක (රු. 457,427/94) මුදලකින් ද, ඊට අදාළ පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ දෙදහස් එකසිය තිහයි ශත විසිහතර (රු. 202,130/24) කින් සමන්විත වූ රුපියල් හයලක්ෂ පනස් නව දහස් පන්සිය පනස් අටයි ශත දහඅටක (රු. 659,558/18) මුලු මුදලක් ද සහ එකී මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් හිඟ හිටවා ඇති මුල් මුදල වන රුපියල් හාරලක්ෂ පනස් හත් දහස් හාරසිය විසිහතයි ශත අනූ හතරක (රු. 457,427/94) මුදල මත, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන සෑම තුන් මසකට වරක් එනම්, එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල වැඩකරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන නැවත මිල කිරීමේ (ප්‍රතිශෝධනය) අවසන් වරට ප්‍රකාශයට පත් කරනු ලැබූ සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) වූ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වැඩිදුර පොළිය ද,

පැමිණිල්ලේ සඳහන් දෙවන නඩු නිමිත්තේ දැක්වෙන පරිදි රුපියල් නවලක්ෂ අනූ හය දහස් නවසිය හැත්තෑ එකයි ශත හැට හතරක (රු. 996,971/64) මුදලක් හා එකී මුදල මත 2019 ජුනි මස 01 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා 15% බැගින් වන පොළිය ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශිත මුදල ගෙවා අවසන් වන තෙක් සමස්ථ මුදල මත 15% බැගින් වන වැඩිදුර පොළිය ද වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 27 දින දරන අධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු වූ ඉහත සඳහන් අයවිය යුතු මුදල්, නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපළ තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් විත්තිකරුට අයකර දීම සඳහා පැමිණිල්ලේ සඳහන් උපලේඛණයගත නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 27 දින පෙ. ව. 11.30 ට,**

එම නිශ්චල දේපළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල නගර සභා බල සීමාව තුළ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවට අයත්, දංකැටිය ග්‍රාමසේවා කොට්ඨාසය තුළ මැඩිල්ල නැමති ගමේ දංකැටිය කොට්ඨාසයට අයත් සුසාන භූමිය පාරේ පිහිටි කුඹුක්ගහ මුලනේ ලැබීම කැබැල්ලේ ලොට් "A" (වී. පී. 280825 දරන) නම් ඉඩම සඳහා, එච්. සිරිබද්දන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද 2002.01.05 දිනැති අංක 1932 දරන පිඹුරේ ලොට් අංක 02 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්,

උතුරට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ද, නැගෙනහිරට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 6 (පාර) ද, දකුණට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 ද සහ බටහිරට : ටී. පී. 60463 දරන ඉඩම ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිනවයයි දශම එකයි බිංදුවක් (පර්. 29.10) විශාල ඉඩම පස, වැවිලි, ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමඟ වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක F 222/285 හි ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම මැතක දී කරන ලද මැනුමකට අනුව පහත පරිදි විස්තර කෙරේ.

ඉහත කී තංගල්ලේ පිහිටි, කුඹුක්ගහ මුලනේ ලැබීම කැබැල්ල යන ඉඩම සඳහා එච්. සිරිබද්දන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද 2013.07.23 දිනැති අංක 5583 දරන පිඹුරේ ලොට් "ඒ" වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්,

උතුරට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ද, නැගෙනහිරට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 6 (මීටර් 3ක් පළල පාර) ද, දකුණට : අංක 1932 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 03 ද සහ බටහිරට : ටී. පී. ටී. පී. 60463 දරන ඉඩම ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිනවයයි දශම එකයි බිංදුවක් (පර්. 29.10) හෝ හෙක්ටයාර් 0.0736) විශාල ඉඩම පස, වැවිලි, ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමඟ වේ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඊ. මුණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 105 සහ 2007/09/08 දින දරන ඔප්පුව මගින් අයිතිය භුක්ති විඳින ලදී.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
තංගල්ල.

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 05 දින.

03-1145

---

# විවිධ දැන්වීම්

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

වත්තල, පරණ මීගමුව පාර, අංක 93 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි කාර්යාලය සහිත නෝර්වුඩ් ෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Norwood Fashions (Private) Limited (PV 100463) සම්බන්ධ කාරණාවේ දී ය.

*නඩු අංකය* : CHC 10/2026/CO
*ස්වභාවය* : ඇවර කිරීම
*පටිපාටිය* : ලඝු

*එදිරිව*

(සංශෝධිත) 2007 අංක 07 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදයේ 270 (ඉ) සහ 270 (ඊ) වගන්ති යටතේ සහ ඒ ප්‍රකාරව අධිකරණය මගින් ඈවර කරනු ලැබීම සඳහා වූ ඉල්ලීමකි.

සෙලාන් බැන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර,
කොළඹ 03.

*...............පෙත්සම්කරු.*

වත්තල, පරණ මීගමුව පාර, අංක 93 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි කාර්යාලය සහිත නෝර්වුඩ් ෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Norwood Fashions (Private) Limited (PV 100463) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 11 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණයට ඉදිරිපත් කොට

ඇති බවත්, එකී පෙත්සම විමසීම වර්ෂ 2026 ක්වූ මැයි මස 18 දිනට නියමකර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

වයෝමා ඒ. පරණගම මහත්මිය සහ ඇයගේ සහාය නීතිඥවරු,
නීති අංශය, සෙලාන් බැන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

***සටහන.-***

එකී පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් පෙත්සම්කරු වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර වර්ෂ **2026.05.17** දින පස්වරු **4.00** ට පෙර භාරදිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතු ය.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 17 දින දී ය.

03-1153

---

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ දී ය**

නොතිසිය

බොරලැස්ගමුව, ලේක්පාර, අංක 106 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති Teastar Ceylon (Private) Limited (පීවී 80160 දරන) නම් සමාගම, 2007 අංක 07 දරන සමාගම් පනතේ (සංශෝධිත පරිදි) 272 වගන්ති යටතේ සහ ඒ ප්‍රකාරව අධිකරණය විසින් ගණන් බලා වසා දැමීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙනි.

CLEF Imports (Pvt.) Ltd.,
අංක 19/2,
බෝගහහේන පාර, බත්තරමුල්ල.

*නඩු අංකය* : CHC/09/26/CO
*ක්‍රියා පටිපාටිය* : සාමාන්‍ය
*ස්වභාවය* : ගණන් බලා වසා දැමීම (සමාගම)
*වටිනාකම* : රු. 83,460,625/=

............*පෙත්සම්කාර සමාගම.*

*එදිරිව*

01. හප්පුරච්චිගේ දොන් බුද්ධි නුවන් කරුණාරත්න,
අංක 106, ලේක් පාර, බොරලැස්ගමුව.

02. අරෝෂ උදේනි ප්‍රියංකර රූපසිංහ,
අංක 57/5/A, තෙලගපත පාර, වනවාසල, කැලණිය.

03. ඉලේපෙරුම ආරච්චිලාගේ දෝන ලලිත කරුණාරත්න,
'රංජනී',
පල්ලෙවෙල, උඩුබද්දාව.

04. මඩප්පුලි ආරච්චිලාගේ දිල්ෂානි මඩප්පුලිආරච්චි,
අංක 349/10/බී, 5 පටුමග, පයිප්ප පාර, කොස්වත්ත,
බත්තරමුල්ල.

05. හප්පුරච්චිගේ දොන් සරත්චන්ද්‍ර කරුණාරත්න,
අංක 106, ලේක් පාර, බොරලැස්ගමුව.

*..............වගඋත්තරකරුවන්.*

2007 අංක 07 දරන සමාගම් පනතේ 272 වගන්තිය යටතේ සහ ඒ ප්‍රකාරව ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නියෝගයක් ලබා ගැනීම පිණිස 2026 පෙබරවාරි මස 02 දින CLEF Imports (Pvt.) Ltd. විසින් මෙම ගරු අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවට මෙයින් නොතිසි ලබා දේ.

මෙම අයදුම්පත 2026 මාර්තු මස 26 දින නොතිසි ආපසු කැඳවීම සඳහා ද, 2026 මැයි මස 15 දින විභාගය සඳහා ද කැඳවනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට හෝ එකී අයදුම්පත සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කිරීමට සහාය දීමට හෝ විරුද්ධ වීමට හෝ අවශ්‍ය වන්නේ නම්, නඩු විභාගය පවත්වන අවස්ථාවේ දී එයට පෙනී සිටිය හැකිය.

පෙත්සම්කරුගේ නීතිඥවරුන් :

රම්සි බචා ඇසෝසියේට්ස්,
අංක 367 3/1, වෙල්ල වීදිය, කොළඹ 12.

දුරකතන අංක : 0112432 433, 0772 650 522
විද්‍යුත් තැපැල : ramzibachaassociates@gmail.com

රම්සි බචා ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ නීතිඥවරුන්.

03-1091

---

## පාර්ලිමේන්තුව

### බුද්ධ ශ්‍රාවක සුරක්ෂිතා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

දේවානන්ද සුරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "බුද්ධ ශ්‍රාවක සුරක්ෂිතා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. " යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී මධ්‍යස්ථානය සංස්ථාගත කිරීමයි.

(අ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන්ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා කායික මානසික සුව පහසුව සැලසීම ;

(ආ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන්ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා ම වෙන්වුන ස්ථානයක් ලෙස පවත්වාගෙන යෑම ; සහ

(ඇ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන්ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකර්ම ලබන කාලය තුළ දී නේවාසිකව සියලු ඇප උපස්ථාන සහිතව වැඩ විසීම සඳහා පහසුකම් සලසා දීම,

යනාදිය වේ.

දේවානන්ද සුරවීම,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

03-1109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.